# 22

# ත්‍රිපිටක පාළියේ ව්‍යාඛ්‍යාන යෙදුම්

ආචාර්ය දේශප්‍රිය ගුණසේන

ත්‍රිපිටකය සංග්‍රහ කිරීම තුළ ම ව්‍යාඛ්‍යානමය මූලික වාග් ප්‍රයෝග කිහිපයක් හමු වේ. එනම්,

1. සූත්‍ර දේශනා සංග්‍රහ කිරීමේ දී උද්දේස, විභංග[1] නිද්දේස[2] යැයි මූලික ප්‍රභේද තුනකි.

2. විනය දේශනා සංග්‍රහ කිරීමේ දී සුත්ත,[3] සුත්තවිභංග,[4] ඛන්ධක, පරිවාර යැයි ප්‍රභේද වේ.

3. අභිධර්ම දේශනා සංග්‍රහ කිරීමේ දී මාතිකා,[5] අට්ඨකථා[6] යැයි ප්‍රභේද වේ.

මෙහි සඳහන් උද්දේස,විභංග, නිද්දේස, සුත්ත, සුත්ත විභංග, මාතිකා, අට්ඨකථා යන මූලික වාග් ප්‍රයෝග කෙටියෙන් විමර්ශනය කළ යුතු වේ.

---

1 *භද්දෙකරත්තස්ස වො භික්ඛවෙ උද්දෙසඤ්ච විභංගඤ්ච දෙසිස්සාමි.*
මජ්ඣිම නිකාය. III. භද්දෙකරත්ත සූත්‍රය. 398 පි.

2 මහානිද්දෙස පාළි, 33 පි.

3 *තත්ථ සුත්තං නාම සකල විනය පිටකෙ පාළි.*
සමන්තපාසාදිකා, I, 161 පි.

4 *සුත්ත විභංගෙති පදභාජනියෙ*
විමති විනොදනී ටීකා, 182 පි.

5 *අභිධම්මමාතිකා*
ධම්මසංගණිප්පකරණ, 02 පි.

6 *අට්ඨකථා කණ්ඩං*
එම, 500-561 පිටු.